ගෙවුම් තුලනය

සමස්ත උපනතීන්

1990 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි කැපී පෙනෙන අංගයක් වූයේ ගෙවුම් ශේෂ තත්ත්වයෙහි ඇතිවූ සැළකිය යුතු වර්ධනයයි. වඩාත් වෙළෙඳ පොළට නැඹුරුවූ විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දීම, බාහිර ගණුදෙනු සම්බන්ධ නීතිරීති තවදුරටත් ලිහිල් කිරීම, ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි වර්ධනය උදෙසා ව්‍යුහාත්මක ගැලපීම් ක්‍රියාත්මක කිරීම, තේ සඳහා වඩාත් වාසිදයක මිළක් ලැබීම, සංචාරක ව්‍යාපාරය යහපත් අතට හැරීම, විදේශ ආධාර වැඩි වශයෙන් උපයෝගී කරගැනීම සහ ආරක්ෂක තත්ත්වය යහපත්වීම හේතුවෙන් ආර්ථික කටයුතු පොදු වශයෙන් යථා තත්ත්වයට පත්වීමද ගෙවුම් තුලනයෙහි යහපත් වර්ධනයක් ඇතිකිරීමෙහිලා හේතු සාධක විය. පසුගිය පස් වසර තුල එක් එක් වසරේදී සමස්ත ශේෂයේ වාර්තා වූ විශාල හිඟයන්ට ප්‍රතිවිරුද්ධව 1990 දී එම ශේෂයෙහි විගැහි දශ ලක්ෂ 130 (රුපියල් දශ ලක්ෂ 6,998) ක අතිරික්තයක් වාර්තා විය. ඛණිජ තෙල් මිල ඉහල යාම ප්‍රමුඛව ගල්ෆ් අර්බුදයේ අයහපත් බලපෑම් මධ්‍යයේ වුවද ගෙවුම් ශේෂයේ වර්ධනයක් දක්නට ලැබීම වඩාත් වැදගත් කොට සැළකිය යුත්තකි.

මෙම වාතාවරණය යටතේ, වෙළෙඳ ගිණුමේ හිඟය 1989 දී විගැහි දශ ලක්ෂ 530 (රුපියල් දශ ලක්ෂ 24,050) සිට 1990 දී විගැහි දශ ලක්ෂ 518 (රුපියල් දශ ලක්ෂ 28,124) දක්වා පහත වැටිණි. පසුගිය වසරේ විගැහි දශ ලක්ෂ 123 (රුපියල් දශ ලක්ෂ 5,609) ක් වූ සේවා ගිණුමේ හිඟය 1990 දී විගැහි දශ ලක්ෂ 56 (රුපියල් දශ ලක්ෂ 3,040) දක්වා සැළකිය යුතු අඩුවීමක් සටහන් කළේය. මේ අතර, ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ලැබීම් විගැහි දශ ලක්ෂ 258 (රුපියල් දශ ලක්ෂ 11,840) සිට විගැහි දශ ලක්ෂ 274 (රුපියල් දශ ලක්ෂ 14,813) දක්වා වැඩිවිය. මැද පෙරදිග රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ ඉපැයීම් ප්‍රේෂණය කිරීම වේගයෙන් වැඩිවීම මෙයට හේතු විය. දළ පෞද්ගලික සංක්‍රාම ලැබීම් 1989 දී විගැහි දශ ලක්ෂ 279 (රුපියල් දශ ලක්ෂ 12,830) හා සසඳන විට 1990 දී විගැහි දශ ලක්ෂ 297 (රුපියල් දශ ලක්ෂ 16,071) ක් විය. කෙසේ වුවද, 1990 දී නිල සංක්‍රාම විගැහි දශ ලක්ෂ 123 (රුපියල් දශ ලක්ෂ 6,698) දක්වා විගැහි දශ ලක්ෂ 24 කින් පහත වැටිණි. එහෙත්, 1989 දී විගැහි දශ ලක්ෂ 248 (රුපියල් දශ ලක්ෂ 11,069) ක් වූ ජංගම ගිණුමේ හිඟය 1990 දී විගැහි දශ ලක්ෂ 177 (රුපියල් දශ ලක්ෂ 9,653) දක්වා අඩු කර ගැනීමට හැකි විය (1.42 සංඛ්‍යා සටහන). ජංගම ගිණුමේ හිඟය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්කල එය ඉකුත් වසරේදී සියයට 4.4 සිට 1990 දී සියයට 3.0 දක්වා අඩුවිය. මේ අතර ප්‍රධාන වශයෙන් රජයේ විදේශීය ණය ගැනීම් වැඩිවීමේ හේතුවෙන්, ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය විගැහි දශ ලක්ෂ 297 දක්වා සියයට 38 කින් ඉහල නැගිණි.

විදේශීය සංචිත තත්ත්වයෙහි වර්ධනය සළකා බලන විට ගෙවුම් ශේෂ තත්ත්වයෙහි යහපත් ක්‍රියාකාරිත්වය වඩාත් අගය කළ හැකිය. 1989 දී විගැහි දශ ලක්ෂ 17 (රුපියල් දශ ලක්ෂ 2,494) ක වැඩිවීමක් පෙන්නුම් කළ දළ නිල සංචිත ප්‍රමාණය 1990 දී විගැහි දශ ලක්ෂ 79 (රුපියල් දශ ලක්ෂ 5,645) කින් වැඩි විය. එසේම, ශ්‍රී ලංකාවේ මුළු දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1989 අවසානයේ දී විගැහි දශ ලක්ෂ 447 (රුපියල් දශ ලක්ෂ 23,390) සිට 1990 අවසානය වන විට විගැහි දශ ලක්ෂ 599 (රුපියල් දශ ලක්ෂ 34,271) දක්වා ඉහළ නැගිණි. එම දළ සංචිත ප්‍රමාණය, 1991 වසර සඳහා ඇස්තමේන්තු කර ඇති ආනයන වලින් ආසන්න වශයෙන් මාස 3.6 ක ආනයන වියදම් පියැවීමට ප්‍රමාණවත් විය.

ගෙවුම් තුලනය

ත්‍රෛමාසිකව



ශ්‍රී ලංකා මහ බැංකුව.

1 . 42 සංඛ්‍යා සටහන

1986 — 1990 ගෙවුම් තුලනය—විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

ශීර්ෂය	විගැහි දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	1986	1987	1988	1989(අ)	1990(ආ)	1986	1987	1988	1989(අ)	1990(ආ)
1· වෙළෙඳ භාණ්ඩ	- 649	- 525	- 568	- 530	- 518	- 21,390	- 20,005	- 24,268	- 24,050	- 28,124
අපනයන	1,029	1,077	1,098	1,207	1,456	33,893	41,097	46,985	56,175	79,481
ආනයන	1,678	1,602	1,666	1,737	1,974	55,283	61,102	71,253	80,225	107,605
2· සේවා	- 109	- 121	- 114	- 123	- 56	- 3,616	- 4,625	- 4,884	- 5,609	- 3,040
ලැබීම්	323	307	306	315	398	10,601	11,721	13,097	14,597	21,729
ගෙවීම්	432	428	420	438	454	14,217	16,346	17,981	20,207	24,769
3· භාණ්ඩ හා සේවා (1+2) ..	- 758	- 646	- 682	- 653	- 574	- 25,006	- 24,630	- 29,152	- 29,660	- 31,164
4· සංක්‍රාම (ශුද්ධ)	395	381	392	405	397	13,097	14,537	16,775	18,591	21,511
පෞද්ගලික (ශුද්ධ)	242	242	238	258	274	7,983	9,226	10,187	11,840	14,813
නිල (ශුද්ධ)	153	139	154	147	123	5,114	5,311	6,588	6,751	6,698
5· ජංගම ගිණුම් ශේෂය (3+4) ..	- 363	- 265	- 290	- 248	- 177	- 11,909	- 10,093	- 12,377	- 11,069	- 9,653
6· මූල්‍ය නොවන ප්‍රාග්ධනය (ශුද්ධ) .	279	234	194	216	297	9,094	9,058	8,308	10,566	16,440
ඍජු ආයෝජන .	24	45	32	14	15	784	1,727	1,382	633	799
පෞද්ගලික දීර්ඝකාලීන (ශුද්ධ) .	15	6	- 32	- 39	- 31	514	213	- 1,341	- 1,803	- 1,650
පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ) .	- 11	30	12	72	49	- 377	1,217	474	3,557	2,793
රාජ්‍ය දීර්ඝකාලීන (ශුද්ධ) ..	251	153	182	169	264	8,173	5,901	7,793	8,179	14,498
ලැබීම් .	350	265	304	291	356	11,425	10,162	13,042	13,811	19,545
ගෙවීම් ..	99	112	122	122	92	3,252	4,261	5,249	5,632	5,047
7· රුපියල් අගය පිළිබඳ ගැලපිලි ..	—	—	—	—	—	1,371	1,841	7	- 108	751
8· විගැහි වෙන් කිරීම් .	—	—	—	—	—	—	—	—	—	–
9· වැරදීම් හා අත්හැරීම් .	19	- 31	32	- 34	10	- 330	- 2,030	723	- 1,294	- 540
10· සමස්ත ශේෂය .	- 65	- 62	- 64	- 67	+ 130	- 1,774	- 1,224	- 3,339	- 1,905	+ 6,998
11· මූල්‍ය වෙනස්වීම් (-අතිරික්තය) .	+ 65	+ 62	+ 64	+ 67	- 130	+ 1,774	+ 1,224	+ 3,339	+ 1,905	- 6,998
විනිමය අනුපාතිකය–ශ්‍රී ලංකා රුපියල්/විගැහි						32·90	38·10	42·76	46·19	54·42
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්										
වෙළෙඳ ගිණුම .						- 11·90	- 10·17	- 10·93	- 9·58	- 8·76
ජංගම ගිණුම .						- 6·67	- 5·12	- 5·58	- 4·41	- 3·01
ජංගම ගිණුම –ප්‍රදානයන් ඉවත්කළ පසු.						- 9·47	- 7·81	- 8·54	- 7·10	- 5·09

(අ) සංශෝධිත. (ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන ; මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ පැවති විනිමය අනුපාතික අනුව පරිවර්තනය කොට ඇත.

ගෙවුම් තුලන විග්‍රහය

වෙළෙඳ ගිණුම

1989 වසරෙහි සියයට 10 ක වැඩිවීමක් පෙන්වූ නිර්යාත ඉපැයීම් 1990 වසරේදී සියයට 21 ක වැඩිවීමක් පෙන්වමින් විගැහි දශ ලක්ෂ 1,456 දක්වා ඉහළ නැගිණි. මෙය පසුගිය පස් වසර තුළ නිර්යාත ඉපැයීම්හි දක්නට ලැබුණු ඉහළම වාර්ෂික වර්ධනයයි. රබර් හා පොල් හැර අනෙකුත් සියළුම ප්‍රධාන නිර්යාත කාණ්ඩවල 1990 වසරේදී සැළකිය යුතු වර්ධන අනුපාතිකයන් වාර්තා කෙරිණි. සම්ප්‍රදායික නොවන නිර්යාත අංශයෙන් 1989 සිට ක්‍රියාත්මක කරන ලද ගැලපුම් ක්‍රියාමාර්ගයනට යහපත් ප්‍රතිචාරයක් ලැබුණ බවක් පෙනිණි. එසේ වුවද, ප්‍රධාන වශයෙන් බොරතෙල් ආනයනය සඳහා කළ ගෙවීම් ඉහළ යාමේ හේතුවෙන් ආනයන වියදම විගැහි දශ ලක්ෂ 1,974 දක්වා සියයට 14 කින් වැඩිවිය. 1989 දී එම වියදමෙහි දක්නට ලැබුණේ සියයට 4 ක වර්ධනයකි (1.42 සංඛ්‍යා සටහන). මෙම වර්ධනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 1990 දී වෙළෙඳ ගිණුමේ හිඟය විගැහි දශ ලක්ෂ 518 ක් වූ අතර, එය 1989 දී පැවැති විගැහි දශ ලක්ෂ 530 ට වඩා ආන්තික අඩුවීමක් පෙන්වයි.

සේවා ගිණුම

සේවා ගිණුමෙහි සැළකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරමින් එම ගිණුමේ හිඟය 1989 දී විගැහි දශ ලක්ෂ 123 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 56 දක්වා අඩුවිය (1.43 සංඛ්‍යා සටහන). ප්‍රධාන වශයෙන් සංචාර හා වරාය, ප්‍රවාහනය සහ රක්ෂණය යන අංශවල ශුද්ධ විදේශ විනිමය ලැබීම්හි වර්ධනයක් වාර්තා විය. සංචාර අංශයෙන් දළ විදේශ විනිමය ලැබීම් 1989 දී විගැහි දශ ලක්ෂ 59 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 102 දක්වා සියයට 73 ක වැඩිවීමක් පෙන්විය. මෙය මූලික වශයෙන් 1990 වසරේ දී සංචාරක ව්‍යාපාරය සැළකිය යුතු මට්ටමකින් යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් වූ අතර, එය සංචාරක පැමිණීම් සියයට 60 ක වැඩිවීමකින් පිළිබිඹු විය. මේ අනුව, සංචාරක ගිණුමේ ශුද්ධ ලැබීම් වසර තුළදී සත් ගුණයකටත් වඩා වැඩිවීමක් පෙන්නුම් කරමින්, 1989 දී විගැහි දශ ලක්ෂ 6 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 44 දක්වා ඉහළ නැගිණි. වෙළෙඳ පරිමාව මෙන්ම ප්‍රවාහන ගාස්තුවලද ඉහළ යාම පිළිබිඹු කරමින් ප්‍රවාහන වියදම් ප්‍රමාණය වැඩිවිය. එහෙත්, මගී ගමන් ගාස්තුවලින් ලද ඉහළ ආදයම්, ඉහත වියදම් ඉක්මවායාම හේතුවෙන් වරාය, ගමනාගමනය හා රක්ෂණ අංශයෙහි විගැහි දශ ලක්ෂ 8 ක අතිරික්තයක් 1990 දී වාර්තා විය. 1989 දී මෙම අංශයෙහි විගැහි දශ ලක්ෂ 8 ක හිඟයක් දක්නට ලැබිණි.

ආයෝජන ආදයම් සම්බන්ධ ශුද්ධ විදේශ විනිමය ගෙවීම් 1989 දී විගැහි දශ ලක්ෂ 124 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 109 දක්වා සියයට 12 කින් අඩුවිය. කෙසේ වුවද, ලාභ හා ලාභාංශ ගෙවීම් දෙවසර තුළදී විගැහි දශ ලක්ෂ 14 සිට විගැහි දශ ලක්ෂ 20 දක්වා වැඩි විය. මෙරට විදේශ වත්කම් තත්ත්වයේ යහපත් වර්ධනයක් පිළිබිඹු කරමින් පොලී ගෙවීම් 1989 දී විගැහි දශ ලක්ෂ 156 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 160 දක්වා ආන්තික වශයෙන් වැඩි වූ අතර විදේශ ආයෝජනයන්හි පොලී ලැබීම් 1989 දී විගැහි දශ ලක්ෂ 46 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 70 දක්වා සැලකිය යුතු වැඩිවීමක් පෙන්විය. මේ අනුව, ශුද්ධ පොලී ගෙවීම් ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 111 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 89 දක්වා පහත වැටිණි.

සංක්‍රාම ගිණුම

මුළු ශුද්ධ සංක්‍රාම ලැබීම් 1989 දී විගැහි දශ ලක්ෂ 405 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 397 දක්වා ආන්තික වශයෙන් පහත වැටිණි. ශුද්ධ පෞද්ගලික සංක්‍රාම 1990 දී විගැහි දශ ලක්ෂ 274 දක්වා සියයට 6 කින් වැඩිවිය. වර්ෂයේ මුල් භාගයේ දී එතෙර සේවය කරන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණයන්හි වැඩිවීමේ උපනතියක් දක්නට ලැබුණු අතර, ඉරාකය විසින් කුවේටය ආක්‍රමණය කිරීමෙන් පසු මැද පෙරදිග රැකියාවල නියුක්තයන් විසින් තම ඉපැයීම් ප්‍රේෂණය කිරීම කඩිනම් කිරීම හේතුවෙන්, වර්ෂයේ දෙවැනි භාගයේදී එම ප්‍රේෂණයන්හි බලාපොරොත්තු වූ තරමේ අඩුවීමක් සිදු නොවීය. කෙසේ වුවද, නිල සංක්‍රාම 1989 විගැහි දශ ලක්ෂ 147 සිට විගැහි දශ ලක්ෂ 123 දක්වා පහත වැටිණි.

1 . 43 සංඛ්‍යා සටහන

1986 – 1990 සේවා සහ සංක්‍රාම

ශීර්ෂය	විගැහි දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	1986	1987	1988	1989 (අ)	1990 (ආ)	1986	1987	1988	1989 (අ)	1990 (ආ)
1. වරාය, ප්‍රවාහනය හා රක්ෂණය ..	– 3	2	5	– 8	8	– 86	25	205	– 322	433
ලැබීම් ..	84	89	95	102	127	2,760	3,366	4,057	4,710	6,907
ගෙවීම් ..	87	87	90	109	119	2,844	3,341	3,852	5,032	6,474
2. සංචාර ..	25	7	– 2	6	44	808	258	– 87	278	2,417
ලැබීම් ..	71	55	48	59	102	2,326	2,107	2,072	2,759	5,596
ගෙවීම් ..	46	48	50	54	58	1,518	1,849	2,159	2,482	3,180
3. ආයෝජන ආදායම් ..	– 117	– 123	– 122	– 124	– 109	– 3,871	– 4,699	– 5,266	– 5,738	– 5,942
ලැබීම් ..	58	53	52	46	71	1,893	2,055	2,197	2,106	3,877
ගෙවීම් ..	175	176	174	170	180	5,764	6,754	7,463	7,845	9,819
3·1 ලාභ සහ ලාභාංශ ..	– 16	– 26	– 13	– 13	– 20	– 501	– 1,025	– 581	– 608	– 1,092
ලැබීම් ..	...	...	1	...	...	15	8	20	18	17
ගෙවීම් ..	16	26	14	14	20	516	1,033	601	626	1,109
3·2 පොලී ..	– 101	– 97	– 109	– 111	– 89	– 3,370	– 3,674	– 4,685	– 5,130	– 4,850
ලැබීම් ..	58	53	51	46	70	1,878	2,047	2,177	2,088	3,860
ගෙවීම් ..	159	150	160	156	160	5,248	5,721	6,862	7,219	8,710
4. රජයේ සේවා ..	– 3	1	1	2	– 1	– 125	45	68	77	– 79
ලැබීම් ..	12	16	17	17	10	383	609	735	785	540
ගෙවීම් ..	15	15	16	15	11	508	564	667	708	620
5. වෙනත් සේවා ..	– 11	– 7	4	2	3	– 344	– 254	196	96	133
ලැබීම් ..	98	94	94	91	88	3,239	3,584	4,036	4,237	4,809
ගෙවීම් .	109	101	90	90	85	3,583	3.828	3,840	4,141	4,676
6. මුළු සේවා ..	– 110	– 120	– 114	– 123	– 56	– 3,616	– 4,625	– 4,884	– 5,609	– 3,040
ලැබීම් ..	323	307	306	315	398	10,601	11,721	13,097	14,597	21,729
ගෙවීම් .	432	427	420	438	454	14,217	16,346	17,981	20,207	24,769
7. පෞද්ගලික සංක්‍රාම ..	242	242	238	258	274	7,983	9,226	10,186	11,840	14,813
ලැබීම් ..	269	270	266	279	297	8,873	10,324	11,386	12,830	16,071
ගෙවීම් ..	27	28	28	21	23	890	1,098	1,200	990	1,257
8. නිල සංක්‍රාම ..	153	139	154	147	123	5,114	5,311	6,588	6,751	6,698
ලැබීම් ..	153	139	154	147	123	5,114	5,311	6,588	6,751	6,698
ගෙවීම් ..	—	—	—	—	—	—	—	—	—	–
9. මුළු සංක්‍රාම ..	395	381	392	405	397	13,097	14,537	16,774	18,591	21,511
ලැබීම් .	422	409	420	426	420	13,987	15,635	17,974	19,581	22,769
ගෙවීම් ..	27	28	28	21	23	890	1 098	1,200	990	1 257

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ජංගම ගිණුම

වෙළෙඳ හා සේවා ගිණුම් තත්ත්වයන් යහපත් අතට හැරීම හේතුකොටගෙන 1990 දී ජංගම ගිණුමේ හිඟය සැළකිය යුතු ලෙස පහත වැටිණි. 1989 දී විගැහි දශ ලක්ෂ 248 (රුපියල් දශ ලක්ෂ 11,069) ක් වූ එම හිඟය 1990 දී විගැහි දශ ලක්ෂ 177 (රුපියල් දශ ලක්ෂ 9,653) ක් වූ අතර පසුගිය හය වසර තුල වාර්තාවූ අඩුම හිඟය විය. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් විට එම හිඟය, ඉකුත් වසරේදී සියයට 4.4 සිට 1990 දී සියයට 3.0 දක්වා අඩු වූ අතර, එය 1984 වසරේ තේ උත්පාතයට පසු වාර්තා වූ අඩුම අනුපාතය විය. ප්‍රදානයන් ඉවත් කළ විට, එම අනුපාතය සියයට අංක දෙකකින්, එනම්, 1989 දී සියයට 7.1 සිට 1990 දී සියයට 5.1 දක්වා අඩුවිය. ජංගම ගිණුමේ හිඟයෙහි දක්නට ලැබුණු මෙම සැළකිය යුතු අඩුවීම 1990 වසරේ ගෙවුම් තුලන වර්ධනයන්හි කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ප්‍රාග්ධන ගිණුම

1990 වසරේදී ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් සියයට 37 කින් වැඩිවී විගැහි දශ ලක්ෂ 297 ක් විය. පෞද්ගලික සෘජු ආයෝජන ප්‍රමාණය වසර තුළදී විගැහි දශ ලක්ෂ 14 සිට විගැහි දශ ලක්ෂ 15 දක්වා ආන්තික ලෙස වැඩි විය. පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේදීද, ණය ආපසු ගෙවීම් නිසා පෞද්ගලික අංශයේ ණය ප්‍රාග්ධන ප්‍රමාණයේ ශුද්ධ ආපසු ගෙවීමක් දක්නට ලැබිණි. එසේ වුවද, පෞද්ගලික අංශයේ දළ ණය ප්‍රාග්ධන ලැබීම් 1989 දී විගැහි දශ ලක්ෂ 10 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 17 දක්වා වැඩිවිය. මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යවසායයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් වැඩියෙන් ණය ලබාගැනීමක් ඉන් පිළිබිඹු වෙයි. පෞද්ගලික අංශය විසින් උපයෝජනය කරන ලද ශුද්ධ කෙටිකාලීන ණය ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 72 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 49 දක්වා අඩුවිය. මෙම අඩුවීම, ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ, ලංකා ඛනිජ තෙල් සංස්ථාව හැර පෞද්ගලික අංශය විසින් උපයෝගී කරගත් සාමාන්‍ය වෙළෙඳ ණය ප්‍රමාණයෙහිය.

රජයට ලැබුණු ශුද්ධ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 169 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 264 දක්වා වැඩි විය. මෙම වැඩිවීමට හේතු වූයේ වසර තුල ලද විදේශීය ණය ප්‍රමාණය වැඩිවීමත්, එම ණය ආපසු ගෙවීම් අඩුවීමත්ය. 1989 දී විගැහි දශ ලක්ෂ 291 ක් වූ දළ විදේශ ණය ලැබීම් 1990 දී විගැහි දශ ලක්ෂ 356 දක්වා වැඩි වූ අතර, සහනදායී නොවන ණය ආපසු ගෙවීම් අඩුවීමේ හේතුවෙන් ණය ආපසු ගෙවීම් ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 122 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 92 දක්වා පහත වැටිණි. මෙම මුළු ණය ප්‍රමාණයට, කෘෂිකාර්මික වැඩ පිළිවෙල (විගැහි දශ ලක්ෂ 10), මූල්‍ය අංශය පිළිබඳ වැඩපිළිවෙල (විගැහි දශ ලක්ෂ 24.5) සහ ආර්ථිකය ප්‍රත්‍යුහගතකරණ ණය (විගැහි දශ ලක්ෂ 31.4) වශයෙන් ව්‍යුහාත්මක ගැලපීම් උදෙසා ගෙවුම් තුලන ආධාර වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ජාත්‍යන්තර සංවර්ධන බැංකුවෙන් ලද විගැහි දශ ලක්ෂ 66 ක්ද ඇතුළත් විය.

විදේශ වත්කම්

1990 අවසානයේදී ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය විගැහි දශ ලක්ෂ 599 ක් විය. මෙය කලින් වසර අවසානයේ පැවති ප්‍රමාණයට වඩා විගැහි දශ ලක්ෂ 152 ක වැඩිවීමක් පෙන්වයි (1.44 සංඛ්‍යා සටහන). රජය සහ මහ බැංකුව සතු විදේශ වත්කම් වලින් සමන්විත නිල සංචිත ප්‍රමාණය වසර තුලදී විගැහි දශ ලක්ෂ 79 කින් වැඩිවී 1990 අවසානය වන විට විගැහි දශ ලක්ෂ 302 ක්ව පැවතිණි. මෙය මුළුමනින්ම 1989 අගදී විගැහි දශ ලක්ෂ 191 ක් වූ මහ බැංකුවේ විදේශ වත්කම් 1990 අග වන විට විගැහි දශ ලක්ෂ 286 තෙක් ඉහළ යාමේ ප්‍රතිඵලයකි. වසර තුළදී, රජය සතු විදේශ වත්කම් විගැහි දශ ලක්ෂ 17 කින් පහත වැටිණි. වාණිජ බැංකු සතු විදේශ වත්කම් විගැහි දශ ලක්ෂ 73 කින් වැඩිවී 1990 අවසානය වන විට විගැහි දශ ලක්ෂ 296 ක්ව පැවතිණි.

1 . 44 සංඛ්‍යා සටහන

1986 – 1990 ශ්‍රී ලංකාවේ විදේශ වත්කම්

කාලච්ඡේදය අවසානයේ අයිතිය	විගැහි දශ ලක්ෂ (අ)					රුපියල් දශ ලක්ෂ				
	1986	1987	1988	1989	1990	1986	1987	1988	1989	1990
1. රජය (ආ) .	27·4	8·6	13·3	32·3	15·8	957·5	373·7	589·8	1,696·1	904·2
2. රාජ්‍ය නියෝජ්‍යත්ව .	—	—	—	—	—	0·6	0·9	0·9	1·0	1·1
3. මහ බැංකුව .	273·7	202·5	193·0	191·3	286·3	9,547·0	8,839·8	8,575·0	9,962·5	16,399·2
4. වෙළෙඳ බැංකු ..	195·0	212·3	221·8	223·2	296·4	6,802·9	9,264·9	9,859·7	11,729·9	16,966·8
5. එකතුව .	496·1	423·4	428·1	446·8	598·5	17,308·0	18,479·3	19,025·4	23,389·5	34,271·3
6. දළ විදේශ සම්පත් මගින් කළහැකි ආනයන – මාස ගණන										
6·1 වෙළෙඳ භාණ්ඩ .	3·5	3·2	3·1	3·1	3·6					
6·2 භාණ්ඩ හා සේවා ..	2·8	2·5	2·5	2·5	3·0					

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්ත්‍ය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්ත්‍ය කර ඇත.

වර්ෂය	1986	1987	1988	1989	1990
විගැහි 1 කට රුපියල්	34.89	43.64	44.45	52.57	57·25

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුලත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

විදේශ වත්කම්
තෛ‍්‍රමාසිකව



ශ්‍රී ලංකා මහ බැංකුව.

විනිමය අනුපාතික සංචලනයන්

සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව 1990 වසරේදී ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටිණි. එසේ වුවද, එක්සත් රාජධානි පවුම හැරුණු විට අනෙකුත් මුදල් වර්ග වලට ප්‍රතිමුඛව රුපියලේ අගය පිරිහීමේ අනුපාතය කලින් වසරට වඩා අඩුවූ බව පෙනේ. ශ්‍රී ලංකා රුපියලේ අගය, ජපන් යෙන්, ඩොයිෂ් මාර්ක්, ප්‍රංශ ප්‍රැන්ක් සහ එක්සත් රාජධානි පවුමට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 4.3, සියයට 9.4, සියයට 10.1 සහ සියයට 14.0 කින් පහත වැටුණු අතර, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 5.7 කින් ඉහළ ගියේය. මැදිහත් මුදල් වර්ගය වූ එක්සත් ජනපද ඩොලරයට ප්‍රතිමුඛව සියයට 0.6 කින් ආන්තික වශයෙන් රුපියලේ අගය පිරිහුණු අතර, විගැහි වලට ප්‍රතිමුඛව සියයට 7.5 ක සැලකිය යුතු පිරිහීමක් පෙන්විය (1.45 සංඛ්‍යා සටහන).

ප්‍රධාන වෙළෙඳ හවුල් කරුවන් සමඟ වූ නාමික විනිමය අනුපාතික වෙළෙඳ බරතැබීම් මත පිළියෙල වූ ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය අනුපාතිකය, ඒකක පදනම අනුව බලන විට මෙම වසරේදී සියයට 8.9 ක පිරිහීමක් පෙන්වීය. එහෙත් ශ්‍රී ලංකාව සහ ඇයගේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් අතර, උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන මූර්ත සඵල විනිමය අනුපාතිකය, ඒකක පදනම අනුව බලන විට සියයට 4.8 ක ඉහලයාමක් පෙන්වීය. මෙම වසරේ මූර්ත සඵල විනිමය අනුපාතිකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 13.4 කින් අඩුවූ අතර, නාමික සඵල විනිමය අනුපාතිකයේ වාර්ෂික සාමාන්‍යය සියයට 5.2 කින් වැඩි විය.

විදේශ ණය

ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය 1990 දී විගැහි දශ ලක්ෂ 203 කින් වැඩිවී එම වසර අවසානයේදී විගැහි දශ ලක්ෂ 4,162 ක් විය. පසුගිය වර්ෂවලදී මෙන්ම මෙම වසරේදීද මුළු ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් රජයේ මැදි හා දිගු කාලීන ණයවලින් සමන්විත විය. නොපියවා ඉතිරිව පැවති රජයේ මැදි හා දිගුකාලීන විදේශීය ණය ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 2,976 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 3,197 දක්වා වැඩිවූ අතර, එය මුළු මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණයෙන් සියයට 83 ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට නොගෙවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය 1989 අවසානයේ දී පැවති විගැහි දශ ලක්ෂ 275 සමඟ සසඳන විට 1990 අවසානයේදී විගැහි දශ ලක්ෂ 288 ක් විය. මෙයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් යටතේ තෙවැනි සහ අවසන් වාරිකය වශයෙන් ලද විගැහි දශ ලක්ෂ 44.5 ක් ද ඇතුලත් විය. නොපියවා ඉතිරිව පැවති කෙටිකාලීන ණය ප්‍රමාණය 1989 දී විගැහි දශ ලක්ෂ 312 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 311 දක්වා ආන්තික වශයෙන් පහත වැටිණි.

ණය සේවා ගෙවීම්

මැදි හා දිගු කාලීන ණය ආපසු ගෙවීම් හා සියලුම විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් ඇතුලත් ණය සේවා ගෙවීම් 1989 දී විගැහි දශ ලක්ෂ 375 සිට 1990 දී විගැහි දශ ලක්ෂ 306 දක්වා විගැහි දශ ලක්ෂ 69 කින් අඩු විය (1.47 සංඛ්‍යා සටහන). ණය ආපසු ගෙවීම්හි මෙන්ම පොලී ගෙවීම්වලද පහත වැටීමක් දක්නට ලැබිණි. ප්‍රධාන වශයෙන් රජයේ ණය ආපසු ගෙවීම් අඩුවීමේ හේතුවෙන් මුළු ණය ආපසු ගෙවීම් 1990 දී විගැහි දශ ලක්ෂ 172 දක්වා විගැහි දශ ලක්ෂ 46 කින් පහත වැටිණි. මේ අතර වසර දෙක අතරතුර පොලී ගෙවීම් විගැහි දශ ලක්ෂ 134 දක්වා විගැහි දශ ලක්ෂ 23 ක අඩුවීමක් පෙන්වීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් ණය ආපසු ගෙවීම් 1989 දී විගැහි දශ ලක්ෂ 46 සිට විගැහි දශ ලක්ෂ 31 දක්වා අඩු වූ අතර පොලී ගෙවීම්ද විගැහි දශ ලක්ෂ 23 සිට විගැහි දශ ලක්ෂ 21 දක්වා පහත වැටිණි. මුළු ණය සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයනයන්ගේ ලැබීම්හි අනුපාතයක් වශයෙන් ගත්කල 1989 දී සියයට 24.6 සිට 1990 දී සියයට 16.5 දක්වා අඩුවිය. මෙය, ණය සේවා ගෙවීම්හි අඩුවීමක මෙන්ම අපනයන ලැබීම්හි වැඩිවීමකද ප්‍රතිඵලයකි. ණය සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයනයන්ගේ සහ පෞද්ගලික සංක්‍රාමයන්ගේ ලැබීම්වල අනුපාතයක් ලෙස ගත්කල, 1989 දී සියයට 20.8 ක්ද, 1990 දී සියයට 14.2 ක්ද විය.

සඵල විනිමය අනුපාතික*

ත්‍රෛමාසික සාමාන්‍යය
1985 = 100



* දර්ශකයේ පහත වැටීම් අගය අඩුවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව.

1 . 45 සංඛ්‍යා සටහන

1986 – 1990 විනිමය අනුපාතික වෙනස්වීම

මුදල් වර්ගය	වර්ෂය අගදී පැවති අනුපාතික (ඒකකයකට රුපියල්)					පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම් (අ)				
	1986	1987	1988	1989	1990	1986	1987	1988	1989	1990
ඩොයිෂ් මාර්ක් ..	14·6727	19·2826	18·4797	23·7002	26·1554	– 24·30	– 23·91	4·35	– 22·03	– 9·39
ප්‍රංශ ප්‍රැන්ක් ..	4·4337	5·6936	5·4121	6·9354	7·7125	– 18·43	– 22·13	5·20	– 21·96	– 10·08
ඉන්දියානු රුපියල් ..	2·1645	2·4043	2·1848	2·3603	2·2332	4·30	– 9·97	10·05	– 7·44	5·69
ජපන් යෙන් ..	0·1794	0·2491	0·2631	0·2816	0·2943	– 24·19	– 27·98	– 5·32	– 6·58	– 4·29
ස්ටර්ලින් පවුම් ..	41·7961	57·1721	59·0786	65·0400	75·5908	– 5·31	– 26·89	– 3·23	– 9·17	– 13·96
ඇ. එ. ජ. ඩොලර් ..	28·5200	30·7625	33·0325	40·0000	40·2400	– 3·90	– 7·29	– 6·87	– 17·42	– 0·60
විශේෂ ගැනුම් හිමිකම් ..	34·7998	43·2684	44·2820	52·9300	57·2479	– 13·70	– 19·57	– 2·29	– 16·34	– 7·54

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාල විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.

සටහන : සෘණ සලකුණින් ශ්‍රී ලංකා රුපියලයෙහි අගය අඩුවීම පෙන්නුම්කරයි.

1 . 46 සංඛ්‍යා සටහන

1986 – 1990 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය

වර්ගය	විගැහි දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	1986	1987	1988	1989(අ)	1990 (ආ)	1986	1987	1988	1989(අ)	1990(ආ)
1. මැදි හා දිගු කාලීන ණය ..	3,227	3,220	3,515	3,647	3,851	111,816	138,411	155,275	190,794	215,787
1·1 රජයේ ණය ..	2,551	2,607	2,849	2,976	3,197	88,760	112,805	126,152	157,512	180,623
1·2 රජයේ ඇපය සහිත රාජ්‍ය සංස්ථා ණය	244	224	184	154	134	8,497	9,703	8,137	8,136	7,559
1·3 රජයේ ඇපය සහිත පෞද්ගලික අංශයේ ණය .	64	96	98	113	112	2,246	4,139	4,359	6,035	6,316
1·4 රජයේ ඇපය රහිත රාජ්‍ය සංස්ථා ණය	22	8	6	6	5	749	329	284	341	295
1·5 රජයේ ඇපය රහිත පෞද්ගලික අංශයේ ණය .	112	120	124	123	115	3,893	5,209	5,482	6,516	6,508
1·6 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ගැණුම් .	234	165	254	275	288	7,671	6,226	10,861	12,255	14,485
2. කෙටි කාලීන ණය .	151	192	174	312	311	5,277	8,348	7,709	15,046	16,925
2·1 මහ බැංකුවේ ණය ගැනීම් ..	—	41	5	56	...	—	1,801	231	2,632	1
2·2 අනෙකුත් (ඇ) .	151	151	169	262	311	5,277	6,547	7,478	12,414	16,924
3. මුළු ණය (1+2) .	3,378	3.412	3,689	3,959	4.162	117,093	146.759	162,984	205,840	232,711
විශේෂිත අයිතමයන් ..										
මැදි හා දිගුකාලීන ණය										
1. යෝජනා ක්‍රම ණය ..	1,549	1,688	1,936	2,150	2,340	53,890	73,015	85,746	113,800	132,209
2. යෝජනා ක්‍රම නොවන ණය .	928	855	887	817	786	32,287	37,003	39,262	43,233	44,415
3. සැපයුම් කරුවන්ගේ ණය .	25	30	25	20	15	870	1,311	1,109	1,046	864
4. ජා. මූ. අ. භාරකාරත්ව අරමුදලේ ණය	59	34	18	9	6	2,055	1,475	813	479	325
5. ජා. මූ. අ. අනෙකුත් ණය .	234	165	254	275	283	7,671	6,226	10,861	12,255	14,485
6. අනෙකුත් (ඇ) ..	432	448	395	378	416	15,043	19,381	17,484	19,981	23,489

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව,
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව.

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය, වෙළෙඳ ණය සහ ම. කො. ආ. කොමිසම යටතේ වූ ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් ණයද ඇතුළත්ව.
(ඇ) රාජ්‍ය සංස්ථා හා පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය.

1 . 47 සංඛ්‍යා සටහන

1986 – 1990 ණය සේවා ගෙවීම්

ශීර්ෂය	විගැහි දශ ලක්ෂ					රුපියල් දශ ලක්ෂ				
	1986	1987	1988	1989 (අ)	1990 (ආ)	1986	1987	1988	1989 (අ)	1990 (ආ)
1. ණය සේවා ගෙවීම් ..	356·8	383·3	402·8	374·7	306·0	11,658	14,539	17,207	17,138	16,666
1·1 ණය ආපසු ගෙවීම් ..	213·5	253·5	258·8	217·3	171·8	6,940	9,623	11,033	9,920	9,355
(i) ජා. මූ. අරමුදලට ..	58·6	69·3	64·1	46·0	31·4	1,856	2,566	2,682	2,018	1,709
(ii) අනෙකුත් ..	154·9	184·2	194 7	171·3	140·4	5,084	7,057	8,351	7,902	7,646
1·2 පොලී ගෙවීම් ..	143·3	129·8	144 0	157·4	134·2	4,718	4,916	6,174	7,218	7,311
(i) ජා. මූ. අරමුදලට ..	21·3	18·3	18·5	22·7	20·6	701	663	772	997	1,121
(ii) අනෙකුත් ..	122·0	111·5	125·5	134·7	113·6	4,017	4,253	5,402	6,221	6,190
2. වෙළෙඳ භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් ..	1,352·6	1,384·4	1,404·0	1,522·4	1854·0	44,495	52,819	60,082	70,772	101,210
3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම ලැබීම් ..	1,622·4	1,654·7	1,670·6	1,801·6	2150·8	53,367	63,143	71,468	83,602	117,281
4. ණය සේවා අනුපාතික (ඇ)										
4·1 2 හි ප්‍රතිශතයක් වශයෙන්										
(i) සමස්ත අනුපාතිකය ..	26·4	27·7	28·7	24·6	16·5	26·2	27·5	28·6	24·2	16·5
(ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර ..	20·5	21·4	22·8	20·1	13·7	20·5	21·4	22·9	20·0	13·7
4·2 3 හි ප්‍රතිශතයක් වශයෙන්										
(i) සමස්ත අනුපාතිකය ..	22·0	23·2	24·1	20·8	14·2	21·8	23·0	24·1	20·5	14·2
(ii) ජා. මූ. අරමුදලේ ගනුදෙනු හැර ..	17·1	17·9	19·2	17·0	11·8	17·1	17·9	19·2	16·9	11·8
5. 1 හි ඇතුලත් රජයේ ණය සේවා ගෙවීම් කොටස ..	161·8	170·5	199·0	196·3	213·1	5,434	6,778	8,612	9,066	11,595
5.1 එය 1 හි ප්‍රතිශතයක් වශයෙන් .	45·3	44·5	49·4	52·4	69·6	46·6	46·6	50·0	52·9	69·6

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැණි වටිනාකම අනුව මෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.